සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

පෙරහුරු පරීක්ෂණය 2022 — 13 ශ්‍රේණිය
practice test 2022 — Grade 13

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I (80)
Information & Communication Technology I (80)

පැය 2 යි
2 hours

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තොරන්න

1. පහත සඳහන් ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ කවරක්ද?
   a. ශිෂ්‍යයෙක් වාර විභාගයක දී ලබාගත් ගණිත ලකුණු ප්‍රමාණාත්මක දත්තයකි.
   b. Covid 19 යනු මාරාන්තික රෝගයකට උදාහරණයක්යන්න ගුණාත්මක දත්තයක් නොවේ.
   c. කාලය ගත වීමත් සමඟ හොඳ තොරතුරක අගය අඩු වී ගොස් එය දත්ත බවට පරිවර්තනය වෙයි.
   d. තොරතුරු වල අදාළත්වය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

   I. a,b,c පමණින් II. a,c,d පමණි III. b,c,d පමණි IV. a b d පමණි V. a,b,c,d සියල්ලම

2. පරිගණක සකසනයක ඇති ප්‍රධාන කොටස් 3 වන පාලන ඒකකය, ගණිතමය හා තාර්කික ඒකකය සහ මතක රෙජිස්තර වල කාර්‍යයන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   a. දත්ත සැසඳීම
   b. මතකය තුළ උපදෙස් විකේතනය කරනු ලැබීම.
   c. සැකසූ තොරතුරු ප්‍රධාන මතකයට යනතෙක් තාවකාලිකව රඳවා තබා ගැනීම

   I. c,b,a II. a,b,c III. b,a,c IV. c,a,b V. b,c,a

3. ස්වයංක්‍රීයව දත්ත ආදානය කිරීමට උපයෝගී කරගත හැකි උපාංග ඇතුළත් පිළිතුර තෝරන්න.
   I. තීරුකේත කියවනය(barcode Reader),ප්‍රකාශ අක්ෂර සංජානන උපක්‍රමය(OCR),ඇඟිලි සලකුණු යන්ත්‍රය(Finger print machine),චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය(MICR)
   II. චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය(MICR),යතුරු පුවරුව(Keyboard), ප්‍රකාශ අක්ෂර සංජානන උපක්‍රමය(OCR),මූසිකය(Mouse)
   III. ඇඟිලි සලකුණු යන්ත්‍රය(Finger print machine),චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය(MICR), මූසිකය(Mouse),වෙබ් කැමරාව(web cam)
   IV. ඩිජිටල් කැමරාව(Digital camera),ප්‍රකාශ අක්ෂර සංජානන උපක්‍රමය(OCR),ඇඟිලි සලකුණු යන්ත්‍රය(Finger print machine),චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය(MICR)
   V. ඇඟිලි සලකුණු යන්ත්‍රය(Finger print machine),චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය(MICR), මූසිකය(Mouse),සුපිරික්ෂකය(scanner)

4. නශ්‍ය මතකයකට උදාහරණයක් සහ එහි ලක්ෂණයක් ඇතුළත් වන පිළිතුර තෝරන්න.

I. ස්ථිතික සසම්භාවී මතකය දිගු කාලයක් විද්‍යුත් ආරෝපණය රඳවා තබා නොගනී.

II. ගතික සසම්භාවී ප්‍රවේශ මතකයෙහි වැඩි ධාරිතාවයක් කුඩා ඉඩ ප්‍රමාණයක රඳවා තැබිය හැක.

III. ප්‍රකම්ක පඨන මාත්‍ර මතකයෙහි දත්ත ඇතුළත් කරනු ලබන්නේ මව් පුවරුව නිෂ්පාදන සමාගම විසිනි.

IV. සංයුක්ත තැටි, සංඛ්‍යාංක බහුවිධ තැටි අයත්වන්නේ ප්‍රකාශ මතක ඒකකයන් ගණයටය.

V. චුම්බකිත පටි, පරිගණක තුළට ඇතුලත් කරන දත්ත සුරක්ෂිත කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.

5. 1010.101_2 යන ද්වීමය සංඛ්‍යාවට අදාල දශමය සංඛ්‍යාව වනුයේ,

I. 105 II. 10.75 III.10.25 IV. 10.5 V. 10.625

6. -13_{10} හි දෙවන අනුපූරක ආකාරය වන්නේ,

I. 00001101_2 II. 11110000_2 III. 00001110_2 IV. 11110011_2 V. 00001111_2

7. පරිගණකයෙහි දත්ත නිරූපනය කිරීම සඳහා භාවිතයට ගන්නා ලද කේත ක්‍රම පිළිබඳව දැක්වෙන වගන්ති සලකා බලන්න

a. 25_{10} යන සංඛ්‍යාව BCD කේත ක්‍රමයෙන් ලියූ විට 00100101_2 ලෙස දැක්විය හැක.

b. තම භාෂාවට අනුව කටයුතු කිරීමේ හැකියාව මිනිස්සුන්ට ලැබුනේ ඇස්කි කේත ක්‍රමය හඳුන්වා දීමත් සමඟය.

c. යුනිකේත ක්‍රමයට අනුව එකිනෙකට වෙනස් සංකේත 65536 නිරූපණය කිරීමට අවස්ථාව ලැබිණි

මෙම වගන්ති වලින් නිවැරදි වන්නේ,

I. a,b පමණි II. a,c පමණි III. b,c පමණි IV. a,b,c සියල්ලම V. කිසිවක් නොවෙයි

8. a. AB_{16} b. 10101010_2 c. 179_{10} d. 261_8 යන සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සැකසූ විට පිළිතුර වන්නේ,

I. a,b,c,d II. a,c,b,d III. b,c,a,d IV. c,b,d,a V. b,a,d,c

9. 

මෙහි ප්‍රතිදානය ලෙස ලැබෙන ප්‍රකාශනය වන්නේ,

I. A+B II. $\overline{A+B}$ III. A.B IV. $\overline{A.B}$ V. $\overline{A.B}$

10. පහත දැක්වෙන කානෝ සිතියම සුළු කිරීමෙන් ලැබෙන පිළිතුර සමාන වන්නේ,

B \ A	0	1
0	**1**	**0**
1	**1**	**1**

I. $\bar{A}+\bar{\bar{B}}$

II. $\overline{A+B}$

III. A.B

IV. $\overline{A.B}$

V. $\overline{A.B}$

11. පහත වැඩ සටහන් වලින් ස්ථිරාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න

a. BOOT b. POST c. BIOS d. CMOS e. BOOTSRAP LOADER

I. a,b,c පමණි II. b,c,d පමණි III. d,c,e පමණි IV. b,c,e පමණි V. ඉහත සියල්ලම

12. මෙහෙයුම් පද්ධති හා සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

I. දෘඪ තැටියෙහි එකම පංගුවක මෙහෙයුම් පද්ධති එකකට වඩා ස්ථාපනය කළ හැක.
II. පරිගණකයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා උපයෝගිතා වැඩ සටහන් ප්‍රයෝජනවත් වේ.
III. Linux වැනි මෙහෙයුම් පද්ධති වල C, D ආදි ලෙස නම් කරන ලද ධාවක නොමැත.
IV. ගොනුවක දිගුව අනුව මෙහෙයුම් පද්ධතිය ගොනුවේ වර්ගය හඳුනා ගනියි.
V. ආරම්භක අවදියේ දී මෙහෙයුම් පද්ධති වල උපදෙස් ඇතුළත් නිරීමට ප්‍රේරකයක් භාවිතා කෙරිණ.

13. මතක කළමණාකරනය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තොරන්න.

I. MMU යනු අතත්‍ය මතක ලිපි යොමුවක් භෞතික මතක ලිපියොමුක් වෙත අනුරූපනය කිරිමේ මෘදුකාංගයකි.
II. ද්විතීයක ආචයනයේ දත්ත තැන්පත් කිරීමට පිටුවක් භාවිතා කෙරේ.
III. ක්‍රියායනයන් පරිගණකයේ ප්‍රධාන මතකයෙන් දෘඪ තැටියටත්, දෘඪ තැටියෙන් ප්‍රධාන මතකයටත් සංචලනය වේ.
IV. ප්‍රධාන මතකයේ මතක ඒකකයක් රාමුවක් ලෙස හැඳින්වේ.
V. භෞතික මතක ධාරිතාවය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී අතත්‍ය මතකය භාවිතයට ගැනේ.

14. තරු ස්ථලකය සම්බන්ධයෙන් කුමක් සාවද්‍ය වේ ද?

I. ජාල උපාංග සියල්ල මධ්‍යගත උපාංගයකට සම්බන්ධ වී ඇත.
II. මධ්‍යගත උපාංග ලෙස නාභිය(HUB) හෝ ස්විචය(SWITCH) භාවිතා කළ හැක.
III. එක් එක් පරිගණකය හරහා දත්ත සම්ප්‍රේෂණය සිදුවේ.
IV. උපාංග එක් කිරීම හා ඉවත් කිරීම පහසු ය.
V. එක් පරිගණකයක් බිඳ වැටුණ ද ජාලයේ ඉතිරි කොටස ක්‍රියාත්මකව පවතී

15. ජාල ස්ථරය සම්බන්ධයෙන් පහත සඳහන් කවර වගන්ති සත්‍ය වේ ද

a. දත්ත පැකට් ලෙස ගමන් කරයි.
b. TCP/IP ආකෘතියේදී අන්තර්ජාල ස්ථරය ජාල ස්ථරය (network Layer)ලෙස හඳුන්වයි
c. FTP සහ IMAP නියමාවලි ක්‍රියාත්මක වේ
d. තෙවන ස්ථර ස්විචය(Layer 3 Switch) ක්‍රියාත්මක වේ.

I. a,b,c පමණි II. a,b,d පමණි III. a,c,d පමණි IV. b,c,d පමණි V. ඉහත සියල්ලම

16. 192.200.100.68/28පරිගණකය සලකන්න. මෙම පරිගණකය අයත් උප ජාලයට අයත් නොවන පරිගණකයේ IP ලිපිනය කුමක්ද

I. 192.200.100.70/28
II. 192.200.100.65/28
III. 192.200.100.72/28
IV. 192.200.100.60/28
V. 192.200.100.78/28

17. B පන්තියේ අයිති ලිපිනයක් සහිත ජාලයක් එකකට පරිගණක 50 බැගින් වන උප ජාල 30 අවශ්‍යව ඇත මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කරගත නොහැකි වන උප ජාල ආවරණ කුමක්ද?

a. 255.255.252.0

b. 255.255.240.0

c. 255.255.255.192

d. 255.255.255.240

I. a පමණි II. b හා d පමණි III. a හා b පමණි IV. a හා c පමණි V. b,c,d පමණි

18. 1011011 යන දත්තය even parity ක්‍රමයට සකසා යැවීමට අදහස් කලේ නම් එය දැන් දැක්වෙන්නේ කුමන ආකාරයකටද?

I. 0100100 II. 11011011 III. 01011011 IV. 10110110 V. 10110111

19. පහත ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශය හෝ ප්‍රකාශ තෝරන්න.

a. ජංගම උපකරණ වලත් පරිගණක තුළත් දත්ත සම්ප්‍රේෂණයට කෙටි පරාස රේඩියෝ තරංග භාවිතා කරයි.
b. සම්ප්‍රේෂණයට සෘජු මාර්ගයක් අවශ්‍ය වීම හා කෙටි දුරකට දත්ත සම්ප්‍රේෂණය වීම අධෝරක්ත කිරණ වල අවාසියකි
c. චන්ද්‍රිකා තාක්ෂණය මගින් විශාල භෞතික ප්‍රදේශයක් ආවරණය කළ නොහැකිය.
d. දත්ත සම්ප්‍රේෂණයට යොදා ගන්නා තරංග වල විස්තාරය, සංඛ්‍යාතය හා කලාව, මූර්ජනය කිරීමකට භාජනය කර සම්ප්‍රේෂණය කරයි.

I. a,b හා d පමණි II. b හා c පමණි III. d හා b පමණි IV. a,b හා c පමණි V. b,c,d පමණි

20.

උපාංගය	කාර්යය
a රිපීටරය (repeater)	p සංඥාවක බලය වැඩි කළ හැකි විද්‍යුත් උපාංගයකි.
b මාර්ගකය (router)	q පරිගණක ජාලයක උපාංග සම්බන්ධ කරන අතර පැකට් මාරුව භාවිතා කරමින් දත්ත ලබා ගැනීමට සහ ගමනාන්ත උපාංගයට දත්ත යොමු කරයි.
c ඇම්ප්ලිෆයර් (amplifier)	r එය අන්තර්ජාලයට හෝ පුද්ගලික පරිගණක ජාලයකට ප්‍රවේශය ලබා දීමට භාවිතා කරයි.
d ස්විචය (switch)	s සම්ප්‍රේෂණය දිගු කිරීම සඳහා භාවිතා කරනු ලබන අතර එමඟින් සංඥාවට වැඩි දුරක් ආවරණය කළ හැකිය.

ඉහත රූප සටහනට අනුව උපාංග අක්ෂරය හා ඊට ගැළපෙන කාර්යයේ අක්ෂරය සඳහන් පිළිතුර වන්නේ,

I	II	III	IV	V
a p	a s	a p	a q	a r
b q	b r	b r	b r	b s
c r	c p	c s	c s	c p
d s	d q	d q	d p	d q

21. අසත්‍ය ප්‍රකාශය තෝරන්න
    I. කවුළු සුපරීක්ෂණය යනු නෙට්වර්ක් ජාලයකට සම්බන්ධ ව පවත්නා පරිගණකයක භාවිතා නොකරන දොරටු මොනවාද යන්න හඳුනා ගැනීමට යොදාගන්නා තාක්ෂණික ක්‍රමවේදයකි
    II. සුදු තොප්පි හැකර්වරුන්ගේ (white hat hackers) කාර්යභාරයක් වන්නේ තොරතුරු පද්ධතියක දත්ත සුරක්ෂිතතාවට ගැටළු ඇති වන ආකාරයේ දුර්වලතා පවතින්නේ ද යන්න අධීක්ෂණය කිරීමයි
    III. බාහිර පාර්ශවයක හෝ අනර්ථකාරී මෘදුකාංගයකින් පරිගණක පද්ධතියට ඇතිවන හානි ආක්‍රමණ ලෙස හැඳින්වේ
    IV. තොරතුරු පද්ධති වෙත අනවසරයෙන් ඇතුළුවන පුද්ගලයින් black hat hackers ලෙස හඳුන්වනු
    V. පරිගණක තුළින් රහස් පද පරිශීලක නාම ක්‍රෙඩිට් කාඩ්පත් අංක ගිණුම් අංක වැනි පෞද්ගලික රහස්‍ය තොරතුරු සොරෙන් ලබා ගැනීමට උත්සාහ කිරීම වෛරස ලෙස හඳුන්වයි

22. පහත තොරතුරු පද්ධති පරීක්ෂා කරන පුද්ගලයින් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
    a. ඒකක පරීක්ෂාව
    b. ඒකාබද්ධ පරීක්ෂාව
    c. පද්ධති පරීක්ෂාව
    d. ප්‍රතිග්‍රහණ පරීක්ෂාව
    I. පරිශීලකයා, මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග ඉංජිනේරු
    II. මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග සංවර්ධන නිලධාරි, පරිශීලකයා, මෘදුකාංග ඉංජිනේරු
    III. මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග ඉංජිනේරු, පරිශීලකයා
    IV. පරිශීලකයා, මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග සංවර්ධන නිලධාරි
    V. මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග සංවර්ධන නිලධාරි, මෘදුකාංග සංවර්ධන නිලධාරි, පරිශීලකයා

23.



මෙම රූප සටහනේ දැක්වෙන ආකාරයට a,b,c,d,e අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
    I. සංඛ්‍යාංක ආචයන ගොනුව, ක්‍රියාවලි අංකය, ක්‍රියාවලි ස්ථානය , ක්‍රියාවලිය, භූතාර්ථය
    II. භූතාර්ථය, ක්‍රියාවලි ස්ථානය , ක්‍රියාවලි අංකය , ක්‍රියාවලිය, සංඛ්‍යාංක ආචයන ගොනුව
    III. සංඛ්‍යාංක ආචයන ගොනුව, ක්‍රියාවලි අංකය, ක්‍රියාවලි ස්ථානය , භූතාර්ථය , ක්‍රියාවලිය
    IV. භූතාර්ථය, ක්‍රියාවලි අංකය, ක්‍රියාවලි ස්ථානය , ක්‍රියාවලිය, සංඛ්‍යාංක ආචයන ගොනුව
    V. භූතාර්ථය, ක්‍රියාවලිය, ක්‍රියාවලි අංකය , ක්‍රියාවලි ස්ථානය, සංඛ්‍යාංක ආචයන ගොනුව

24. පුස්තකාල කළමනාකරණ පද්ධතියක් සම්බන්ධයෙන් කාර්යබද්ධ ,කාර්ය බද්ධ නොවන අවශ්‍යතා හැරුණු විට වෙනත් අවශ්‍යතාවයක් දැක්වෙන පිළිතුර තෝරන්න

I. පොතක නම අංකය අනුව අවශ්‍ය පොතක් සොයා ගත හැකි විය යුතුය
II. පුස්තකාල පද්ධතිය සඳහා යන වියදම රුපියල් ලක්ෂ දෙකකට වඩා අඩු විය යුතුය
III. පද්ධතිය අනවසර ප්‍රවේශකයන්ගෙන් ආරක්ෂා විය යුතුය
IV. පද්ධතියට ඇතුළු වීමට රිශීලකයන්ගේ අනන්‍යතාවය සහතික කළ යුතුය
V. දවස පුරාම පද්ධතිය ක්‍රියාත්මක විය යුතුය

25. නිශ්චිත ....ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක වන අන්තර් .... සහිත .... සමූහයක එකතුවක් .... ලෙස හැඳින්වේ.

හිස්තැන් පිරවීම සඳහා සුදුසු වචන අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න

I. සම්බන්ධතාවයක් ,සංඝටක, අරමුණක් ,පද්ධතියක්
II. සම්බන්ධතාවයක්, සංඝටක ,පද්ධතියක් ,අරමුණක්
III. අරමුණක් ,සම්බන්ධතාවයක්, පද්ධතියක්, සංඝටක
IV. අරමුණක්, සම්බන්ධතාවයක් ,සංඝටක ,පද්ධතියක්
V. සම්බන්ධතාවයක් ,සංඝටක, අරමුණක්, පද්ධතියක්

26. පහත සඳහන් පයිතන් ප්‍රකාශයේ ප්‍රතිදානය කුමක් ද?

```
z = "xyz"

j = "j"
while j in z:
    print(j, end=" ")
```

I. xyz II. j z III. Error IV. ප්‍රතිදානයක් නොපෙන්වයි V. jjjj.....

27. පහත සඳහන් පයිතන් ප්‍රකාශයේ ප්‍රතිදානය කුමක් ද?

```
arr = [3 , 2 , 5 , 6 , 0 , 7, 9]
add1 = 0
add2 = 0
for elem in arr:
    if (elem % 1 == 0):
        add1 = add1 + elem
        continue
    if (elem % 3 == 0):
        add2 = add2 + elem
print(add1 , end=" ")
print(add2)
```

I. 18 0 II. 32 III. 0 32 IV. 0 18 V. 32 0

28. පහත සඳහන් දත්ත අයත්වන පයිතන් දත්ත වර්ග (data types) අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

'win', ['Kumara',55,'male'], ('abc',45,'xyz'), {2:'name', 'tel':'0722222222'}

I. string, float, double, array
II. tuple, list, string, dictionary
III. string, long, float, complex
IV. string, array, integer, list
V. string, list, tuple, dictionary

29. පහත සඳහන් පයිතන් ප්‍රකාශයේ ප්‍රතිදානය කුමක් ද?

```
x = 'pqrs'
for i in range(len(x)):
    x[i].upper()
print (x)
```

I. pqrs II. PQRS III. Error IV. ප්‍රතිදානයක් නොපෙන්වයි V. Pqr

30. පහත ගැලීම් සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.



මෙම ගැලීම් සටහනේ ප්‍රතිදානයන් පිලිවළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

I. 8,11,14,17,20,23,26 II. 8,11,14,17,20,23 III. 8, 11,22,44,88 IV. 11,22,44,88 V. 11,22,44

31. පහත දැක්වෙන පයිතන් කේතයෙහි ප්‍රතිදානය කුමක්ද?

```
y='school'
b=len(y)
for i in range(b):
   print("hello")
```

I. school යන වචනය 6 වතාවක් මුද්‍රණයවේ
II. hello යන වචනය 6 වතාවක් මුද්‍රණයවේ
III. දෝෂයක් සහිත පණිවුඩයක් දර්ශනයවේ
IV. 6 යනුවෙන් මුද්‍රණය වේ
V. කිසිවක් තිරය තුළින් දක්නට නොලැබේ

32. පහත දැක්වෙන පයිතන් ප්‍රකාශයෙහි අගය කුමක්ද?

```
7+2*8/2**4
```

I.. 8.0 II. 8 III. 9 IV. 9.0 V. Error

33. පහත දැක්වෙන පයිතන් කේතය ක්‍රියාත්මක කළ විට ප්‍රතිදානය කුමක් වේද?

```
def fun(x=3,y=2):
   x=x+y
   y+=1
   print(x,y)
fun()
```

I. 32 II. 5 3 III. 5 IV. 22 V. 35

34. දත්ත සෙවීමේ ශිල්ප ක්‍රම යටතේ හඳුනා ගන්නා අනුක්‍රමික සෙවීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න

I. අනුක්‍රමික සෙවීම යනු දත්ත ආරාවක ආරම්භයේ සිට පියවරෙන් පියවර සොයන දත්තය හමුවන තෙක් ඉදිරියට ගමන් කිරීමයි
II. අනුක්‍රමික සෙවීම මගින් ඉතා ඉක්මනින් දත්තයක් සොයා ගැනීමේ හැකියාව පවතී
III. ඉක්මනින් දත්තයක් සොයා ගැනීමේ හැකියාව අනුක්‍රමික සෙවීම මගින් කළ නොහැක
IV. දත්ත ප්‍රමාණාත්මකව අඩුවන විට අනුක්‍රමික සෙවීම ආකාර්යක්ෂම වේ
V. ඉහත කිසිවක් අනුක්‍රමික සෙවීම සම්බන්ධව නිවැරදි ප්‍රකාශ නොවේ

35. X=[10,20,30,40,50,60]
print(X[-2])

ඉහත දැක්වෙන පයිතන් කේතය ක්‍රියාත්මක කළ විට ප්‍රතිදානය කුමක් වේද?

I. 30 II. 10 III. 40 IV. 60 V. 50

36. මෙහි දක්වා ඇති HTML කේතය මගින් ලැබෙන ප්‍රතිදානය පිළිබඳව වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

<img src = “flower.jpg” alt= “flower” >

I. පින්තූරය හෝ flower යන වචන දෙකෙන් එකක් පමණක් ප්‍රදර්ශනය වේ.
II. පින්තූරයක් ප්‍රතිදානය ලෙස ලැබෙන අතර පින්තූරය ඇතුළතින් flower ලෙස දර්ශනය වේ.
III. පින්තූරයක් ප්‍රතිදානය ලෙස ලැබෙන අතර පින්තූරයට යටින් flower ලෙස ප්‍රදර්ශනය වේ.
IV. පින්තූරය දර්ශනය වීමක් සිදු වේ.නමුත් යම් හෙයකින් පින්තූරය දර්ශනය නොවුනොත් flower යන වචනය දර්ශනය වේ.
V. ඉහත කිසිවක් නොවේ.

37. වෙබ් අඩවියක් වඩාත් අලංකාරව නිර්මාණය සඳහා .... භාවිතා කළ හැක. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

I. HTML II. FTP III. CSS IV. Java Script V. XML

38. පහත දැක්වෙන URL (ඒකකාර සම්පත් නිශ්චායකය) සලකන්න.

http://www.edupub.gov.lk/Administrator/Sinhala/10/buddhist10.pdf

එහි නියමාවලිය සහ ගොනු නාමය දැක්වෙන නිවරදි පිළිතුර තෝරන්න.

I. http, buddhist10.pdf
II. www, buddhist10.pdf
III. html, buddhist10.pdf
IV. gov.lk, buddhist10.pdf
V. http, buddhist1.pdf

39.
```
<html>
 <body>
  <ul>
    <li>Printers</li>
       <ol type="A">
          <li>Impact Printers</li>
             <ul type="square">
                <li>Dot Matrix Printer</li>
                <li>Line Printer</li>
             </ul>
          <li>Non Impact Printers</li>
```

```
            <ul type="square">
              <li>Laser Printer</li>
              <li>Bubble Printer/Ink Jet Printer</li>
               <li>Thermal Printer</li>
             </ul>
          </ol>
       </ul>
     </body>
   </html>
```

මෙහි ප්‍රතිදානය වන්නේ,

I

- Printers
  1. Impact Printers
     - Dot Matrix Printer
     - Line Printer
  2. Non Impact Printers
     - Laser Printer
     - Bubble Printer/Ink Jet Printer

II

- Printers
  1. Impact Printers
     - Dot Matrix Printer
     - Line Printer
  2. Non Impact Printers
     - Laser Printer
     - Bubble Printer/Ink Jet Printer
     - Thermal Printer

III

- Printers
  - A. Impact Printers
    - Dot Matrix Printer
    - Line Printer
  - B. Non Impact Printers
    - Laser Printer
    - Bubble Printer/Ink Jet Printer
    - Thermal Printer

IV

- Printers
  1. Impact Printers
  2. Dot Matrix Printer
  3. Line Printer
  4. Non Impact Printers
  5. Laser Printer
  6. Bubble Printer/Ink Jet Printer
  7. Thermal Printer

V

1. Printers
   - Impact Printers
   - Dot Matrix Printer
   - Line Printer
   - Non Impact Printers
   - Laser Printer
   - Bubble Printer/Ink Jet Printer
   - Thermal Printer

40. පහත php කේතයෙහි ප්‍රතිදානය කුමක් ද?

```
<?php
$name=array("Bandara","Kamal","Nihal");
echo"$name[1]";
print"<br>";
echo"$name[2]";
print"<br>";
echo"$name[0]";
?>
```

I. Bandara,Kamal,Nihal
II. Bandara,Kamal
III. Nihal,Bandara,
IV. Kamal,Nihal,Bandara
V. ඉහත කිසිවක් නොවේ.

ඔසුසලකින් බෙහෙත් බෙදාහැරීම සම්බන්ධ පහත භූථාර්ථ සම්බන්ධතා සටහන සලකන්න. ඒ අනුව 41 සිට 45 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



41. මෙම සටහනට අනුව ගනණීයතාවය සඳහා a:b ට සුදුසු පිළිතුර වන්නේ,

I. ඒක: ඒක II. බහු:බහු III. ඒක: බහු IV. බහු: ඒක V. කිසිවක් නොවේ

42. මෙම සටහනට අනුව සැකසෙන තාර්කික සටහනෙහි වගු ගණන කීය ද?

I. 5 II. 2 III. 4 IV. 3 V. 1

43. ඔසුසල වගුවෙහි ප්‍රාථමික යතුර සඳහා සුදුසු උපලැකිය කුමක් ද?

I.නගරය II. නම III. ලි_ප_අංකය,නම IV. ලි_ප_අංකය V. නම,නගරය

44. බෙදාහැරීමේ වගුවක් සැකසෙන්නේ නම් එහි අඩංගු උපලැකි වන්නේ,

I. නම,නගරය
II. ලි_ප_අංකය, නම
III. ඔසු_කේතය, නම
IV. නිකුත් කළදිනය , ලි_ප_අංකය , ඔසු_කේතය
V. ලි_ප_අංකය , ඔසු_කේතය

45. නිෂ්පාදන සමාගම සඳහා වෙනස් සංකේතයක් භාවිතා කිරීමට හේතුව කුමක් ද?

I. බහු අගය උපලැකිය
II. උපලැකිය
III. සංයුක්ත උපලැකිය
IV. භූථාර්ථය
V. දුර්වල උපලැකිය

46. ඉහත භූථාර්ථ සම්බන්ධතා සටහනට අනුව සැකසෙන දත්ත පාදක ගොනුවේ ඔසුසල යන්න සඳහා Pharmacy(<u>Registration_No</u>, Name, Town) වගුව නිර්මාණය කර ඇත.එක් ඔසුසලක් '3333' යන අංකයෙන් ලියාපදිංචි වී ඇත.එහි සියළුම දත්ත බලා ගැනීමට සුදුසු SQL ප්‍රකාශය තෝරන්න.

I. SELECT * FROM Pharmacy;
II. SELECT Name FROM Pharmacy where Registration_No='3333';
III. SELECT * FROM Pharmacy where Registration_No='3333'
IV. SELECT * FROM Pharmacy WHERE Registration_No='3333';
V. SELECT * FROM Pharmacy where Registration_No='1111';

47. Pharmacy වගුවෙහි Town උපලැකියට සංක්‍රාන්තික පරායත්ත තාවයක් ඇත්නම් එය කුමන ප්‍රමතකරණ අවස්ථාවේ පවතී ද?

I. පළමු ප්‍රමතකරණය
II. දෙවන ප්‍රමතකරණය
III. තෙවන ප්‍රමතකරණය
IV. සිව්වන ප්‍රමතකරණය
V. ශූන්‍ය ප්‍රමතකරණය

48. බහු නියෝජිත තාක්ෂණය යන්නට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

I. කිසියම් පරිසරයක් තුළ ක්‍රියාත්මක වන, අන්තර් ක්‍රියාකාරී, බුද්ධිමත් නියෝජිතයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත පරිගණක පද්ධතියකි.
II. බහු නියෝජිත පද්ධතියක ප්‍රධාන ලක්ෂණ ලෙස ස්වයං පාලනය, දේශීය දැක්ම විමධ්‍යගතකරණය ආදිය දැක්විය හැක.
III. මෙය දෙන ලද උපදෙස් අනුව ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වේ.
IV. වර්තමානයේ බහු නියෝජිත තාක්ෂණය බෙහෙවින් ප්‍රයෝජනයට ගැනේ.
V. මෙය පරිගණක වැඩ සටහනක් නොවේ.

49. අන්තර් ජාල සේවා සපයන ආයතන මගින් අපට ලබා දී ඇති වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම අයත් වන්නේ කුමන e සේවාවට ද?

I. B2C II. G2C III. C2B IV. B2B V. G2E

50. අතත්‍ය වෙළඳ ප්‍රදර්ශනාගාර සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

I. ඊ- ව්‍යාපාර වර්ගයකි.
II. අතත්‍ය වෙළෙඳ ප්‍රදර්ශනාගාරයක් යනු ව්‍යාපාරික වෙබ් අඩවියකි නොවේ.
III. පාරිභෝගිකයන්ට යොමුවී භාණ්ඩ හෝ සේවා විමසීමට පුළුවන.
IV. පාරිභෝගිකයන්ට යොමුවී භාණ්ඩ ඇණවුම් කිරීමට පුළුවන.
V. මුදල් ගෙවීමට හා මිලදී ගැනීමට හැකියාව තිබේ.